**ශීර්ෂ 108 - තැපැල් සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ තැපැල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දක්වා ඇත.

**1. තැපැල් සේවා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් තැපැල් සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂ** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 108 | තැපැල් සේවා අමාත්‍යාංශය | 2015.09.02 |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | 2015.09.02 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 10,086 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 9,993 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු. මිලියන 51 ක් හා රු. මිලියන 42 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 0.4 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂ** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 108 | 359 | 308 | 51 | 14.2 |
| 308 | 9,727 | 9,685 | 42 | 0.4 |
| **එකතුව** | **10,086** | **9,993** | **93** | **0.9** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා 20.01.02.00 දරන ආදායම් සංකේතයට අදාළව රු. මිලියන 6,200 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 6,557 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 357 කින් හෙවත් සියයට 6 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

**2.3 අත්තිකාරම් ගිණුම්**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 10801 | 4.0 | 3.0 | 1.9 | 2.8 | 30.0 | 10.2 |
| 30801 | 650.0 | 557.7 | 520.0 | 563.9 | 2,200.0 | 1,757.8 |

**2.4 අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. මිලියන 732.17 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **අග්‍රිම ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.මිලියන** |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 7002/0000/00/0349/0014/000 | 0.63 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0098/0014/000 | 731.54 |
| **එකතුව** | | **732.17** |

**2.5 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 50.39 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලයන |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0022/000 | 5.87 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0162/000 | 44.52 |
| | | 50.39 |

**2.6 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව තැපැල් සේවා අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 108 - තැපැල් සේවා අමාත්‍යාංශය**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.300,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 17 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 85 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 10801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.11,125,572 ක් වී තිබුණත්, පාලන ගිණුම අනුව එය රු.10,231,005 ක් වී තිබුණි. ඒ අනුව රු.894,567 ක වෙනසක් අනාවරණය විය.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.206,391ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 04 සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන නමුත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3 බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන රු.41,694,964 ක් වූ අතර එම බැරකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ පරිගණක හා පරිගණක උපාංග ලබාගැනීම වෙනුවෙන් රු.36,526,500 ක බිල්පත් 2014 දෙසැම්බර් මාසය අවසානයට ලැබී තිබුණි. එම බැරකම්වලින් රු.12,636,000 ක් 2015 ජූනි 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(i) ට අනුකූල නොවී වැය විෂයයන් 12 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.2,102,559 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී ගෙවන ලද 2014 වර්ෂයට අදාලව එළඹ තිබුණු රු.434,103 ක බැරකම්, විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

## 3.4 දේශීය මූලාකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------------

තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 12/2007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබුණු අතර එමගින් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි.

(අ) අපේක්ෂිත ආදායම එකතු කිරීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

(ආ) නව ව්‍යාපාර කටයුතුවලින් ආදායම ඉපැයීමේ ක්‍රමෝපායක් ස්ථාපිත කිරීම

(ඇ) තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ගෙන ආදායම හා වියදම් සම තත්ත්වයේ පවත්වාගෙන යාම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 300 ක වියදම් ඇස්තමේන්තුවක් සහිතව 2008 වර්ෂයේදී ආරම්භ කර 2012 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි. එසේ වුවත් අදාල කටයුතු වර්ෂ 02 ක් ප්‍රමාද වී 2014 වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබුණි.

(ii) මුල් පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 648.8 දක්වා එනම් සියයට 116 කින් වැඩිකර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 514.27 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 174.52 ක් වුවද, ඒ වෙනුවෙන් රු.මිලියන 135.93 ක් වැය කර තිබුණි. එය ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 78 ක් පමණක් වි තිබුණි.

(iii) ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු වැඩ අවසන් කිරීමේ වාර්තාවක් සකස් කළ යුතු වුවත් එය සකස් කර නොතිබුණි.

(iv) ව්‍යාපෘතිය තුළින් ලබා කරගැනීමට බලාපොරොත්තු වූ එක් අරමුණක් වූයේ තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වා ගෙන යාම වූවත්, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,984 ක අලාභයක් ලබා තිබුණි. පසුගිය වසර හා සැසඳීමේදී එම අලාභය රු.මිලියන 125 කින් වැඩිවී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණ සමාලෝචිත වර්ෂයේදී ලඟාකර ගෙන නොතිබුණි.

(v) ව්‍යාපෘතිය මගින් හඳුන්වා දී තිබූ MORS හා E-pay මෘදුකාංගවල දුර්වලතාවයන් පැවතීම නිසා මුදල් ඇණවුම් ගිණුම පිළියෙල කිරීමේදී පහත අඩුපාඩු සිදු වී තිබුණි.

- 2013 වර්ෂයේ මුදල් ඇණවුම් නිකුත් කිරීම් හා ගෙවීම් සියල්ල පරිගණක පද්ධතියට ඇතුළත් කර නොතිබීමෙන් නිවැරදිව මුදල් ඇණවුම් නිකුතු, ගෙවීම් හා කොමිස් ආදායම් ගණනය කළ නොහැකි වීම.
- පරිගණක පද්ධතිය තුළින් කේවල ශේෂ ලැයිස්තුවක් ලබාගැනීමට නොහැකි වීම.
- 2013 වර්ෂයේ නොපියවූ මුදල් ඇණවුම් ශේෂය පරිගණක පද්ධතියෙන් ලබාගත නොහැකි වූ නිසා රජයේ ආදායමට බැර කළ යුතු ශේෂය හා ඉදිරියට ගෙන යා යුතු ශේෂය හඳුනා ගැනීමට නොහැකි වීම.
- මුදල් ඇණවුම් නිකුත් කිරීම්, මුදල් ඇණවුම් ගෙවීම් හා මුදල් ඇණවුම් කොමිස් ආදායම පිළිබඳ දෙපාර්තමේන්තු පරිගණක මෘදුකාංග මගින් ලබාගෙන තිබූ ශේෂයන් හා මුදල් ඇණවුම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව ශේෂයයන් අතර පිළිවෙලින් රු.මිලියන 4,957 ක්, රු.මිලියන 3,589 ක් හා රු.මිලියන 20 ක වෙනස්කම් පැවැතුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**---------------------------------------------------------------**

පහත සඳහන් මිලදී ගැනීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

**(අ) පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, අඛණ්ඩ විදුලි සැපයුම් ඒකක හා වෛරස් ආවරණ 500 ක් මිලදී ගැනීම**

**-----------------------------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී තැපල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපාතිය සඳහා පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, විදුලි සැපයුම් අඛන්ඩව සැපයුම් ඒකක හා වෛරස් ආවරණ 500 ක් රු.72,387,000 කට මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උක්ත ප්‍රසම්පාදනය සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික වශයෙන් තරඟකාරී ලෙස ලංසු කැඳවා නොතිබුණි.

(ii) 2013 නොවැම්බර් 07 දින පැවැති ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී සුදුසුකම් ලත් සැපයුම්කරුවකු තෝරා ගැනීමට නොහැකි වී තිබුණි. ලංසු ඉදිරිපත් කළ

ආයතන 05 කින් එකතු කිරීමේ අගය මත බදු (VAT) හැර රු.69,350,000 ක් ලෙස අවම ලංසුව පහත සඳහන් හේතු ඉදිරිපත් කරමින් ප්‍රතික්ෂේප කර තිබුණි.

- අවම වශයෙන් රු.මිලියන 25 ක ශුද්ධ ද්‍රවශීල වත්කම් ලංසුකරු වෙත තිබිය යුතු වුවත්, ඔහු සතු රු. මිලියන 6.15 ක ද්‍රවශීල වත්කම් පැවැතීම හා
- ලංසුකරුගේ නොවන වෙනත් ගබඩාවකින්/ආයතනයකින් නඩත්තු සහ තාක්ෂණික සේවා සැපයීමට ලංසුකරු අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වූ ගිවිසුම් ඉදිරිපත් කළ යුතු වුවත්, එම ගිවිසුම් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අවුරුදු 03 ක විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගැනීමේදී 2012/2013 මූල්‍ය ප්‍රකාශන ලබාගැනීමට හැකියාව තිබියදී 2009/2010, 2010/2011 හා 2011/2012 යන වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන ලබාගෙන තිබුණි.

(iv) 2014 ජනවාරි 02 දින නැවත ජාතික වශයෙන් තරඟකාරී ලෙස ලංසු කැඳවීමක් නොකර පෙර ලංසු කැඳවීම් ක්‍රමයම භාවිතා කර, පළමු ප්‍රසම්පාදනයේදී සුදුසුකම් නොලත් ලෙස සැලකූ සැපයුම්කරුවන්ගෙන් නැවත ලංසු කැඳවා තිබුණි. ඒ අනුව මාස 02 කට පෙර සුදුසුකම් නොලත් ලෙස සැලකූ සැපයුම්කරුවන්ට මේ සඳහා නැවත මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සළසා දී තිබුණි.

(v) දෙවන ප්‍රසම්පාදනයේදීද අවම මිල ගණන් පෙර ලංසුකරු විසින්ම ඉදිරිපත් කර තිබුණි. එම ලංසුවේ විටිනාකම එකතු කළ අගය මත බදු (VAT) හැර රු.72,387,000 ක් විය. මෙහිදී 2012/2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සළකා බලා තිබුණු අතර එහිදී ආයතනයේ ශුද්ධ ද්‍රවශීල වත්කම් සියයට 39 දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව එම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(vi) පළමු ප්‍රසම්පාදනයේදී අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගෙන් 2012/2013 මුදල් වර්ෂයට අදාළ විගණිත මූල්‍ය ප්‍රකාශන ලබා ගෙන හා එම ලංසුකරු සමඟ සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු ලබාගෙන ඔහු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කිරීමෙන් අමාත්‍යාංශයට රු.3,037,000 ක් ඉතිරි කර ගැනීමට අවස්ථාව තිබුණි. එසේම ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2013 වර්ෂයේදීම අවසන් කිරීමටද හැකියාව පැවැතුණි.

**(ආ) පරිගණක හා පරිගණක උපාංග 250 ක් මිලදී ගැනීම**

**-----------------------------------------------------------**

තැපැල් ජාල සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය පරිගණක ප්‍රමාණය එකවර තීරණය කිරීමකින් තොරව පරිගණක උපාංග 500 ප්‍රසම්පාදනය නිමවීමත් සමගම නැවත ඇණවුමක් මගින් රු.36,526,500 කට පරිගණක හා පරිගණක උපාංග 250 ක් ඉහත සඳහන් පෞද්ගලික ආයතනයෙන් 2014 ජූලි 11 දින මිලදී ගැනිමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ 2014 ප්‍රසම්පාදන සැලැස්මට අනුව තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ පරිගණක හා පරිගණක උපාංග මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය 2014 පෙබරවාරි 14 දින වන විට අවසන් කළ යුතු වුවද, මෙම ප්‍රසම්පාදනය 2015 පෙබරවාරි 02 දින සම්පූර්ණ කර තිබුණි.

(ii) මෙම පරිගණක මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය. .

- තැපැල් මූලස්ථානයේ පහත සඳහන් අංශ සඳහා ලබාදී තිබූ පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර භාවිතයකින් තොරව 2015 ජූලි 10 දින වන විටත් ඇසුරුම්වල බහා තිබුණි.

| අංශය | අයිතමය | සංඛ්‍යාව |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ අංශය | පරිගණක හා පරිගණක උපාංග | 15 |
| | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 05 |
| තැපැල් කළමනාකරණ පුහුණු අංශය | පරිගණක හා පරිගණක උපාංග | 20 |
| | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 01 |

- 2015 ජූනි 29 දින වන විට පරිගණක මුද්‍රණ යන්ත්‍ර 28 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවැතුණි.

ඉහත කරුණු අනුව පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම අවශ්‍යතාවයකින් තොරව සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) කුලී පදනම මත වාහනයක් ලබා ගැනීම**

**-----------------------------------------**

නියෝජ්‍ය අමාත්‍යවරයාට කුලී පදනම මත වාහනයක් ලබාගැනීමේදී අමාත්‍යාංශය විසින් ලංසු කැඳවීම කළ යුතු වුවත්, එසේ නොකර නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ආයතන 3

කින් මිල ගණන් ලබාගෙන අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රු.245,000 ක මාසික කුලී පදනම මත 2014 මාර්තු මාසයේදි ගිවිසුමකට එළඹීමෙන් තොරව වාහනයක් ලබා ගෙන තිබුණි.

**(ඇ) ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව අවම වශයෙන් වසරකට එක් වරක් හෝ යාවත්කාලීන කළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා එම ලැයිස්තුව යාවත්කාලීන කර නොතිබුණි.

## 3.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) විෂය භාර අමාත්‍යවරයා වෙත ඩීසල් වාහන 02 ක් හා එක් පෙට්‍රල් වාහනයක් වෙන්කර තිබියදී ඩීසල් වාහනයකට හා පෙට්‍රල් වාහන දෙකකට වශයෙන් වාහන 03 කට ඉන්ධන දීමනාව ලබාදී තිබුණි. ඒ අනුව 2010 ජුනි මාසයේ සිට 2014 ජූලි මාසය දක්වා වැඩිපුර රු.2,160,000 ක් ගෙවා තිබුණි. එම දීමනාව රු.50,000 ක් බැගින් වාරික 43 කින් හා රු.10,600 ක් වූ එක් වාරිකයකින් අයකර ගැනීමට තීරණය කර තිබුණද, එසේ අයකර ගැනීමට හෝ මේ පිළිබඳව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අමාත්‍යවරයාගේ ලේකම්වරයා සඳහා ඩීසල් වාහනයක් වෙන්කර දී තිබියදී පෙට්‍රල් වාහනයක් සඳහා මාසික ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. 2014 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා රු.88,560 ක් වැඩිපුර ගෙවා තිබුණි. පෙර වර්ෂවලදීද මෙසේ වැඩිපුර ගෙවූ ඉන්ධන දිමනාව ගණනය කර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) මුද්දර පොතක් පිළියෙල කිරීම**

**----------------------------------**

මුද්දර ඇතුළත් පොත් 1,000 ක් පිළියෙල කිරීම සඳහා අනුග්‍රාහක හවතුන්ගෙන් 2012 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දායක මුදල් ලබාගෙන රු.5,088,899 ක් පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනුග්‍රාහක හවතුන්ගෙන් එකතු කර ගත් මුදල් එම කාර්යය සඳහා සම්පූර්ණයෙන් නොයොදා තැපැල් සේවා අමාත්‍යාංශයේ හා තැපැල් දෙපාර්තමේන්තුවේ 108-1-2-2502 හා 308-2-1-2502 දරන වැය විෂයයනවලින් රු.3,600,000 ක් වැය කර තිබුණි. එබැවින් එසේ අනුග්‍රාහක හවතුන්ගෙන් එකතු කර ගත් මුදලින් රු.1,224,757 ක් පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දින වන විටත් රඳවා ගෙන තිබුණි.

(ii) අතිගරු ජනාධිපතිවරයා වෙත නිකුත් කරන ලද මුද්දර පොත් 150 ක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාරදීම සඳහා නිලධාරියෙකු විසින් භාර ගෙන තිබුණි. එම පොත්වලින් පොත් 100 ක් ජනාධිපති ලේකම් කාර්යාලයට භාරදුන් බවත්, පොත් 50 ක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාර දුන් බවත්, තැපැල්පති විසින් විගණනය වෙත දන්වා තිබුණි. නමුත් අදාළ පාර්ශවයන් විසින් එම පොත් භාරගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මුද්දර පොත් පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව සඳහා සහභාගිවන රාජ්‍ය නායකයින්ට පිරිනැමීමට හා දේශීය හා විදේශීය ගැනුම්කරුවන් වෙත අලෙවි කිරීමට සැලැසුම් කර තිබුණද, එම සමුළුව ආරම්භ වූ දින වන විටත් පොත් මුද්‍රණය කර නොතිබුණි. විගණන දිනය වූ 2015 අප්‍රේල් 16 දින වන විට මුද්දර සහිත පොත් 17 ක් හා මුද්දර රහිත පොත් 45 ක් පමණක් අලෙවිය සඳහා නිකුත් කර තිබුණි. 2015 අප්‍රේල් 16 දින වන විට මුද්දර සහිත හා රහිත වශයෙන් පිළිවෙලින් 4 ක් හා 17ක් පමණක් රු.455,000 කට අලෙවි කර තිබුණි.

(iv) පොත් මුද්‍රණයේ අරමුණෙන් බාහිරව මුද්‍රණය කරන ලද පොත්වලින් සමාලෝචිත වර්ෂයේදී රු.3,050,000 ක් වටිනා මුද්දර සහිත පොත් 61 ක් හා රු.2,820,000 ක් වටිනා මුද්දර රහිත පොත් 188 ක් පුද්ගලයන් හා ආයතන වෙත නොමිලේ බෙදා හැර තිබුණි.

(v) මෙසේ පුද්ගලයන් හා ආයතන වෙත නොමිලේ ලබාදුන් මුද්දර සහිත පොත්වල ඇතුළත් රු.237,113 ක මුද්දරවල වටිනාකම පියවා ගන්නා ආකාරය විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි.

(vi) මුද්දර පොත පිළියෙල කිරීම වෙනුවෙන් මාණ්ඩලික සහකාරවරයෙකුට දිනකට රු.500 බැගින් දින 500 කට අනුග්‍රාහක භවතුන්ගෙන් ලද මුදලින් රු.250,000 ක් ත්‍රීවීලර් ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව එවැනි ගෙවීම් ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය මත සිදු කළ යුතු වුවත්. එසේ කර නොතිබුණි. ගෙවීම් කළ ගමන් පිළිබඳවද කිසිඳු සාක්ෂියක් වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) හිටපු තැපැල් සේවා අමාත්‍යවරයාගේ උපදේශකවරයෙකුගේ මාසිකව වැටුප ලබා නොගැනීමට හේතු විමසීමකින් තොරව 2013 මාර්තු 01 දින සිට 2014 අප්‍රේල් 30 දින දක්වා වැටුප හා අනෙකුත් දීමනා ලෙස එකතුව රු.992,010 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2014 ජූනි 20 දින හිමිකරුගේ අනන්‍යතාවය තහවුරු කර නොගෙන ලේඛනය අවලංගු කරන ලද රු.992,010 ක් වටිනා චෙක්පතක් ඔහුගේ නියෝජිතයකු වෙත භාරදී තිබුණි.

(ආ) 2010 නොවැම්බර් 22 දිනැති ගැසට් නිවේදනය මගින් තැපැල් සේවා අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණද, එදිනට පැවැති වාහන එම අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර නොතිබුණි. එදිනට පෙර පැවති තැපැල්, විදුලි සංදේශ හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් නමින් වාහන 14 ක් ලියාපදිංචි කර තිබුණි.

(ඇ) 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව ධාවන තත්ත්වයේ නොපවතින සහ අරපිරිමැසුම්දායී අන්දමින් පාවිච්චිය සඳහා අළුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවත්, තැපැල් සේවා අමාත්‍යාංශය සතු වාහන 03 ක් 2014 ඔක්තෝබර් 15 දින වන විට ගර්භිත තත්ත්වයේ පැවතිණි.

(ඇ) වාරිමාර්ග ජල කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වාහනයකට 2012 ඔක්තෝබර් 03 දිනෙන් පසුව ඉන්ධන ලබාගැනීම සිදුකර හෝ දෛනික ධාවන සටහන්

විගණනයට ඉදිරිපත් කර හෝ නොතිබුණු බැවින් එම වාහනයේ පාවිච්චිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර 2014 නොවැම්බර් 11 දින අදාල අමාත්‍යාංශය වෙත එම වාහනය ආපසු භාරදී තිබුණි.

(ඉ) වාරිමාර්ග ජල කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2010 වර්ෂයේදී රැගෙන ආ වාහනයක් සංචිත වාහනයක් ලෙස වාහන ලේඛනයේ දක්වා තිබුණි. එම වාහනය සඳහා දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණ අතර අමාත්‍යාංශය වෙතින් ඉන්ධන ලබාගැනීමද සිදුකර නොතිබුණි. එම වාහනය නඩු කටයුත්තක් සඳහා ගල්කිස්ස දිසා අධිකරණ භූමියේ තබා ඇති බව 2015 ජූලි 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඊ) අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් 2014 ජනවාරි 04 දින දක්වා පාවිච්චි කර තිබුණු අමාත්‍යාංශයේ වාහනය සම්බන්ධයෙන් එදිනෙන් පසු දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම වාහනය 2014 ජනවාරි 31 දින ගරාජ් කර තිබුණත්, විගණන දිනය වූ 2014 ඔක්තෝබර් 15 දින වන විටත් වාහනය ආපසු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(උ) අමාත්‍යාංශයේ සංචිත වාහනයක් 2012 සැප්තැම්බර් 05 දිනෙන් පසු ධාවනයේ යොදවා ගත් බවට අවශ්‍ය සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 2014 ජූනි 28 දින දක්වා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා විසින් පාවිච්චි කර තිබුණු වාහනයේ එදිනට මයිලෝ මීටරය අනුව කිලෝ මීටර් 203212 ක් ධාවනය කර තිබුණි. මෙම වාහනය අළුත්වැඩියා කටයුතු සඳහා 2014 ජූලි 17 දින සිට 2014 ඔක්තෝබර් 15 දින දක්වා ගරාජයේ තිබූ බව විගණනය වෙත දන්වා තිබුණි. එදින සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී එම වාහනයේ මයිලෝ මීටරය අනුව කිලෝ මීටර් 210162 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව රාජකාරී සඳහා වෙන් නොකර තිබූ කාලය තුළදී කිලෝ මීටර් 6,950 ක් ධාවනය කර තිබුණද ඒ සඳහා ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන්ධනද ලබාගෙන නොතිබුණි.

(එ) නිල වාහන වෙන්කර තිබියදී අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකු හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් සංචිත වාහන 03 ක් පාවිච්චි කර තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතික මට්ටම | 52 | 44 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 28 | 23 | 05 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 03 | 01 |
| | **එකතුව** | **99** | **82** | **17** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 17 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**4. ශීර්ෂ 308 - තැපැල් දෙපාර්තමේන්තුව**

**4.1 අග්‍රිම ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිසා ගිණුම් කාර්යාලවල නොපියවූ උප අග්‍රිම ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත්, එසේ නොකර රු.1,270,928 ක් වූ නොපිය වූ උප අග්‍රිම ශේෂයද ඇතුළත්ව දිසා ගිණුම් කාර්යාලවල පැවැති මුදල් ශේෂ 2015 වර්ෂයේ අග්‍රිම ගිණුමට මාරුකර තිබුණි.

(ආ) Hongkong and Shanhai Banking Corporation ගනුදෙනුවලට අදාලව ආරම්භ කර තිබුණු බැංකු ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට පැවැති රු.313,432 ක ශේෂය 2015 ජුලි 29 දින වන විටත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා අවස්ථා 30 කදී එකතුව රු.600,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 18 කදී එකතුව රු.1,306,489 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**4.2 පොදු තැන්පත් ගිණුම**

2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවැත එන රු.10,598,926 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.3 ආදායම් ගිණුම**

ආදායම් සංකේතය 20.01.02.00 දරන අදායම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරිකෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 6,200 ක් වි තිබුණු අතර රු.මිලියන 6,557ක ආදායමක් රැස් කරගෙන තිබුණි. ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී තාත්වික සංඛ්‍යා භාවිතා නොකර කල්පිත සංඛ්‍යා භාවිතා කිරීම නිසා ඒ ඒ

ආදායම් විෂයයන්ගේ ඇස්තමේන්තුගත ආදායමෙහි හා තථ්‍ය ආදායමෙහි විශාල වශයෙන් විචලනයන් සිදුවී තිබුණි. ඒ කෙරෙහි පහත සඳහන් කරුණු බලපා තිබුණි.

(i) ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 11 ක සිට සියයට 1,619 ක් දක්වා වූ විචලනයන් සිදු වූ ආදායම් විෂයයන් 32 ක් විය.

(ii) මරණ දැන්වීම් කොමිස්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කොමිස්, ලිපි කළමනාකරණය හා හයිබ්‍රිඩ් ටෙලිමේල් සඳහා ආදායම් 2014 වර්ෂයට ඇස්තමේන්තු කර නොතිබුණද, 2014 වර්ෂයේදී එම ආදායම් විෂයයන් සඳහා පිළිවෙලින් රු.119,829, රු.26,385, රු.2,335,612 ක් හා රු.25,000 ක් වශයෙන් එකතුව රු.2,506,826 ක් වූ ආදායම් රැස් කරගෙන තිබුණි.

(iii) දුරකථන ආදායම ලෙස රු.1,800,000 ක් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුළදී ලැබී තිබුණු රු.3,201,012 ක දුරකථන ආදායම එම ආදායම් සංකේතය යටතේ දක්වා නොතිබුණි. එය විවිධ තැන්පත් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(iv) පැය 4 කූරියර් සේවා ආදායම 2014 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවේ සඳහන් කර නොතිබුණ අතර ආදායම් රැස්කරද නොතිබුණි. එම සේවාව සඳහා රු.2,919,785 ක හිඟ ආදායමක් 2014 දෙසැම්බර් 31 දිනට වූ ආදායම් ගිණුමේ සඳහන් කර තිබුණි.

**(ආ) හිඟ ආදායම**

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව ජාත්‍යන්තර ගිණුමේ රු.52,872,816 ක ආදායමක් හිඟ හිට තිබූ අතර එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයකට අදාල විය. එම හිඟ ආදායම අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දිනට අංශ තුනක ඒකාබද්ධ කළ හිඟ හිටි ආදායම් ලෙස රු.162,665,021 ක ගිණුමේ දක්වා තිබුණි. නමුත් එම අංශ විසින් පිලියෙල කර තිබුණු හිඟහිටි ආදායම්වල එකුතව රු.138,253,795 ක් වී තිබුණි. ඒ අනුව රු.24,411,226 ක වෙනසක් අනාවරණය විය.

(iii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟහිටි නිදහස් තැපැල් ආදායම රු.30,420,493 ක් හා

සමාලෝචිත වර්ෂයට රු.5,887,526 ක් වශයෙන් එකතුව රු.36,308,019 ක ආදායම් හිඟහිට තිබුණි.

(iv) ජාත්‍යන්තර තැපැල් ගනුදෙනු සඳහා වූ හිඟ ආදායම් වාර්තාව අනුව 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අදාලව අළුතින් හඳුනා ගත් හිඟ ආදායම ලෙස රු.140,080,547 ක ශේෂයක් ගැලපීම් කර තිබුණි. මේ හේතුවෙන් ජාත්‍යන්තර තැපැල් හිඟ ආදායම ලෙස වර්ෂය අවසානයේදී අනාවරණය කරන අගය තාත්ත්වික වී නොතිබුණි.

**(ඇ) වාර්තා කිරිම**

**--------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාල සීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේදී ආදායම් පහළ යෑම සියයට 10 ක සිට සියයට 100 ක පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණද, ආදායම් විෂයයන් 15 ක ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.278,756,304 කින් අඩුවී තිබුණි. කෙසේ වුවද මෙම අඩුවීම් සම්බන්ධව ඉහත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන ක්‍රියාකර නොතිබුණි.

(iii) 2006 සැප්තැම්බර් 27 දිනැති අංක 187/2006 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි ආදායම් රැස්කරනු ලබන දත්ත පදනම් කරගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මාසිකව පිළියෙල කරනු ලබන ගිණුම් ප්‍රකාශ සමඟ දෙපාර්තමේන්තු පොත් අනුව පෙන්වන අගයන් සැසඳීම් කර වාර්තාවක් ඊලඟ මාසය අවසන් වන දිනට ප්‍රථම රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයේ ජූලි, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල එසේ කටයුතු කර නොතිබුණි.

**(ඈ) ආදායම් ගිණුමගත කිරීම**

**----------------------------**

සමාලෝචිත වර්ෂයේ මුදල් පොත අනුව ජාත්‍යන්තර තැපැල් ආදායම රු.37,842,890 ක් වී තිබුණත්, ආදායම් ගිණුමෙහි එම ආදායම රු.40,213,565 ක් ලෙස දක්වා තිබුණි. 2013 වර්ෂයේදීද ජාත්‍යන්තර තැපැල් ආදායම් මුදල් පොත හා ආදායම් ගිණුම සමඟ එකඟ වී නොතිබුණි. ආදායමින් කොටසක් නියෝජ්‍ය ගණකාධිකාරීගේ ගිණුමට බැර වී තිබීම එම වෙනසට හේතු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදීද එම වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) සන්නිවේදන පියස් ආදායම**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැපැල් දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක සන්නිවේදන පියස් පිළිබඳව තොරතුරු විමසා තැපැල්පති වෙත නිකුත් කරන ලද 2015 පෙබරවාරි 12 දිනැති ලිපියට අදාලව තොරතුරු 2015 ජූලි 30 දින වන විටත් විගණනය වෙත ලබාදී නොතිබුණි. එබැවින් දැනට ක්‍රියාත්මක වන හා ක්‍රියාත්මක නොවන සන්නිවේදන පියස් හා ඒ ඒ සන්නිවේදන පියස්වල ආදායම හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2000 නොවැම්බර් 07 දිනැති අංක 14/2000 දරන තැපැල්පතිගේ චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව සන්නිවේදන පියස්වල සෑම මාසයක් අවසානයේදී ලාභ අලාභ ගිණුමක් පිළියෙල කළ යුතු වුවත්, එසේ නොකර සන්නිවේදන පියස්වල ලැබීම් හා ගෙවීම් ගිණුම්ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

(iii) 2014 අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් දක්වා ලද ආදායම වූ රු.44,184,797 ක් සන්නිවේදන පියස් ආදායම් ගිණුමේ පෙන්වා තිබුණද, එම කාල සීමාව දක්වා වූ ලැබීම් හා ගෙවීම් තැන්පත් ගිණුමේ පෙන්වා තිබුණි. විස්තර පහත පරිදි විය.

| | රු. |
|---|---|
| 2014.01.01 දිනට ශේෂය | 35,262,146 |
| 2014 වර්ෂය තුළ ලැබීම් | 36,673,316 |
| | ------------- |
| | 71,935,462 |
| 2014 වර්ෂය තුළ ගෙවීම් | 64,894,194 |
| | ------------- |
| **2014.12.31 දිනට ශේෂය** | **7,041,268** |
| | ======= |

මෙසේ තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණු ආදායම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවත්, එසේ නොකර හා උපචිත පදනමට ගිණුම්වල ගැලපීම් සිදු නොකිරීම නිසා 2014 ජනවාරි 01 දිනට වූ රු.35,262,146 ක ශේෂය වර්ෂය අවසාන වන විට රු.7,041,268 ක් දක්වා අඩුවී තිබුණි.

**4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

විෂය අංක 30801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.42,730,199 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 ජූනි මාසය සඳහා ණය සහ අත්තිකාරම් පිළිබඳ ණයහිමි ලේඛනයේ සඳහන් රු.215,903 ක ශේෂය, ප්‍රධාන ගිණුම් කාර්යාලය විසින් පිළියෙල කරන ලද අත්තිකාරම් ගිණුමේ ස්ථාන මාරු වී පැමිණි උප ලේඛනයේ දක්වා නොතිබුණි.

(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි නිලධාරියකු ස්ථාන මාරු වී ගිය පසු මාස 02 ක් ඇතුළත එම ණය ශේෂ පියවා ගත යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකළ මුළු ණය ශේෂය රු.260,945 ක් වී තිබුණි.

(ඈ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, කොළඹ මහ නගර සභාව හා හෝමාගම අධ්‍යාපන කාර්යාලයට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගත යුතු රු.599,015 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකවර නිරවුල් කර නොගෙන මාසික වාරික වශයෙන් අය කිරීමට කටයුතු කර තිබුණි.

(ඉ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය හා දිසා ගිණුම් කාර්යාලවල පාලන ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු.1,756,537,839 ක් හා රු.1,757,801,644 ක් වූයෙන් රු.1,263,805 ක වෙනසක් විය.

**4.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් හා බේරුම් නොකළ බැරකම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ප්‍රධාන කාර්යාලය, මධ්‍යම තැපැල් හුවමාරු මධ්‍යස්ථානයේ සහ ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාල 11 ක සමීක්ෂණ මණ්ඩල වාර්තා 2015 ජුලි 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය වෙනුවෙන් 2015 වර්ෂයේ ගෙවන ලද රු.962,951 ක බැරකම්, විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවී වැය විෂයයන් 11 කට අදාලව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.187,427,193 ක බැරකම්වලට එළඹ තිබුණි.

**4.7 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

තැපැල් දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම හා වියදම පසුගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2014 | වෙනස | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 5,907 | 6,557 | 650 | 11 |
| වියදම | 8,766 | 9,541 | 775 | 8 |
| මෙහෙයුම් ඌනතාවය | 2,859 | 2,984 | 125 | 4 |

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමස්ථ ආදායම සියයට 11 කින් වැඩි වී තිබුණද ,මෙහෙයුම් ඌනතාවය සියයට 4 කින් වැඩිවී තිබුණි. එය පසුගිය වර්ෂයේ ඌනතාවයට සාපේක්ෂව රු.මිලියන 125 ක වැඩිවීමකි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද වැටුප් වැඩිවීම ඇතුළුව වියදමේ වැඩිවීම බලපා තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

2014 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවූ අවස්ථා 11 ක් පැවති බව නිරීක්ෂණය විය.

**4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 149,742 | 948,586 | 500,000 | 1,598,328 |
| (ii) | නිකුත්කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 69,221 | - | - | 69,221 |
| (iii) | හඳුනා නොගත් හර | 2,000 | 100 | 50,000 | 52,100 |
| (iv) | හඳුනා නොගත් බැර | 23,160 | - | - | 23,160 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම ගිණුම් 05 ක තැන්පත් කළ නමුත් මාස 06 ක කාලයක් ඉක්මවීමෙන් පසුවද 2014 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ රු.1,598,328 ක වටිනාකමකින් යුතු තැන්පතු 63 ක් පැවතුණි.

(ආ) යාපනයේ දිසා ගිණුම් කාර්යාලයේ ජංගම ගිණුමේ 2012 වර්ෂයට අදාල රු.276,588 ක් වටිනා චෙක්පත් 50 ක්, 2013 වර්ෂයට අදාල රු.672,000 ක් වටිනා චෙක්පත් 06 ක් හා 2014 ජනවාරි මස තැන්පත් කරන ලද රු.5,000 ක් වටිනා චෙක්පත් 02 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ඇ) කොළඹ දකුණ දිසා ගිණුම් කාර්යාලයේ ජංගම ගිණුමට අදාලව 2007 වර්ෂයේ සිට පැවත එන රු.500,000 ක උපලබ්ධි නොවූ තැන්පත් ශේෂයක් දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශවල පෙන්නුම් කර තිබුණි. එමෙන්ම 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයට අයත් වර්ෂ 3 කට වැඩි කාලයක සිට හඳුනා නොගත් රු.50,000 ක ගෙවීම් සම්බන්ධයෙන් පැවැති විමර්ශනය 2015 ජූලි 17 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) මුදල් පොතේ ශේෂය ඉක්මවා ගෙවීම් නොකළ යුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ ගිණුමේ 2014 දෙසැම්බර් 31 දින මුදල් පොතේ සීමාව ඉක්මවා රු.20,259,436 ක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත පියවා තිබුණි.

**4.9 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව සිදු කර තිබුණු බව නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ටින් ඩොකට් හා ඊයම් මුද්‍රා සැපයීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඊයම් මුද්‍රා කිලෝ ග්‍රෑම් 15,000 ක් රු.7,039,200 ක වටිනාකමකට හා ටින් ඩොකට් කිලෝ ග්‍රෑම් 5,000 ක් රු.2,228,800 කට සපයා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන සඳහා 2014 පෙබරවාරි 21 දින කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණද එම සැපයීම සිදු කිරීමට එම කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වී තිබුණි.

(ii) 2014 වර්ෂයේදී ටින් ඩොකට් හා ඊයම් මුද්‍රා සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් විසින් එම කොන්ත්‍රාත්කරුට භාණ්ඩ සැපයීමට ඇති හැකියාව සනාථ කරගෙන තිබුණද ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ටින් ඩොකට් හා ඊයම් මුද්‍රා කොන්ත්‍රාත්කරු විසින් සපයා නොතිබුණි.

**(ආ) හණ ලණු බෝල හා හණ ලණු කැරලි මිලදී ගැනීම**

හණ ලණු බෝල හා හණ ලණු කැරලි මිලදී ගැනීම සඳහා 2014 පෙබරවාරි 21 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර එම ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව හණ ලණු බෝල කිලෝ ග්‍රෑම් 10,000 ක් රු.3,190,000 ක වටිනාකමට හා හණ ලණු කැරලි කිලෝ ග්‍රෑම් 10,000 ක් රු.2,960,000 ක වටිනාකමකට 2014 ජූලි 21 දිනට පෙර තැපැල් දෙපාර්තමේන්තුවට සැපයිය යුතු වුවත්, එම දිනය වන විට එක් එක් අයිතමයන්ගෙන් පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 5,061 ක් හා කිලෝ ග්‍රෑම් 5,890 පමණක් සපයා තිබුණි.

**(ඇ) මුද්‍රා ලාකඩ සැපයීම**

**----------------------**

මුද්‍රා ලාකඩ සැපයීම සඳහා 2014 පෙබරවාරි 21 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර එම ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුමට අනුව මුද්‍රා ලාකඩ කිලෝ ග්‍රෑම් 20,000 ක් රු.4,160,000 කට 2014 ජූලි 21 දින වන විට තැපැල් දෙපාර්තමේන්තුවට සැපයිය යුතු වුවත් එදින වන විට කිලෝ ග්‍රෑම් 14,730 ක් පමණක් සපයා තිබුණි. ඉහත පරිදි අදාල සැපයීම නියමිත කාලය තුළදී ගබඩාවට නොලැබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඈ) ලියාපදිංචි සැපයුම්කරුගේ ලැයිස්තු**

**------------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ලැයිස්තුව අවම වශයෙන් වසරකට එක් වරක්වත් යාවත්කාලීන කළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා එම ලැයිස්තු යාවත්කාලීන කර නොතිබුණි.

**(ඉ) වාහන අමතර කොටස් හා ටයර් මිලදී ගැනීම**

**------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ශ්‍රී ලංකා රුපියල් 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, අවස්ථා 05 කදී රු.500,000 ක සීමාව ඉක්මවූ එකතුව රු.15,064,968 ක් වටිනා වාහන අමතර කොටස් මිලදී ගැනීම්වලදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශයට පටහැනිව ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව එකතුව රු.2,312,353 ක් වටිනා ටයර් මිලදී ගෙන තිබුණි.

**(iii)** අවශ්‍යතාවය බුෂ් අපර් ආම් 06 ක් වුවත්, ගබඩාවේ සම්පූර්ණ අපර් ආම් 16 ක් තිබියදී මිට්ෂුබිෂි නියෝජිත ආයතනයෙන් සම්පූර්ණ අපර් ආම් 06 ක් රු.164,010 කට මිලදී ගෙන තිබුණි.

**(iv)** යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ පරණ ටයර් ඇතුළත් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණ අතර පරණ ටයර් වෙන්දේසි කිරීමේදී එදිනට පැවතෙන

ටයර් ප්‍රමාණය ගණනය කර වෙන්දේසියට ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මේ හේතුවෙන් ගබඩාවෙන් නිකුත් කරන අළුත් ටයර් වෙනුවට වාහනවල තිබූ ටයර් ගබඩාවට භාර දුන්නේද යන්න හා එම සියළුම ටයර් වෙන්දේසි කළේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

**(ඊ) තොරතුරු තාක්ෂණ අංශයේ සර්වර් පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීම**

---

ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව 2014 ජනවාරි 17 දින රු.13,333,499 ක වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත පිරිනමා තිබූ අතර එම සමාගමේ ඉල්ලීම මත තවත් දින 30 ක් මෙම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2014 මාර්තු 26 දින සැපයීම් සිදුකළ යුතු වුවද, තවත් දින 41 ක ප්‍රමාදයකින් පසුව 2014 මැයි 06 දින සැපයීම් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** උක්ත ප්‍රසම්පාදනය දින 41 ක් ප්‍රමාදවී තිබියදීත් මුද්දර කාර්යාංශය සඳහා සර්වර් පරිගණක යන්ත්‍ර 02 ක් නැවත ඇණවුම් කිරීමේ පදනම මත එම සමාගමෙන් මිලදී ගෙන තිබුණි.

**(ii)** 2014 අගෝස්තු 15 දින හෝ ඊට පෙර මෙම යන්ත්‍ර සැපයිය යුතු වුවද, එම ප්‍රසම්පාදනයද නියමිත දින සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

**(උ) ලිපි තරාදි 400 ක් මිලදී ගැනීම**

---

සමාලෝචිත වර්ෂයේදී ලිපි තරාදි 400 ක් රු.4,928,000 කට මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික වශයෙන් කරගහකාරී ලෙස ලංසු කැඳවීම සිදු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ආයතන 10 කින් පමණක් ලංසු කැඳවා තිබුණි. සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුමකටද එළඹ නොතිබුණි.

**(ඌ) ඩෙස්ක්ටොප් පරිගණක 80 ක් මිලදී ගැනීම**

---

ඩෙස්ක්ටොප් පරිගණක 80 ක් රු.9,445,360 කට මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත මිල කැඳවීම් සිදු

නොකර එක් ආයතනයකින් පමණක් සෘජුවම මිල ගණන් ලබාගෙන තිබුණ අතර ගිවිසුමකටද එළඹ නොතිබුණි. මිලදී ගත් පරිගණකවලින් එක් පරිගණකයක් පමණක් පිරිවිතර සමඟ පරීක්ෂා කර තිබුණි. එසේ පරීක්ෂා කරන ලද පරිගණකය අවස්ථා තුනකදී පිරිවිතර සමඟ එකඟ වී නොතිබුණි.

**(එ) මදුරන්කුලිය තැපැල් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම**

ඉහත සඳහන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එකතු කළ අගය මත බදු සමඟ රු.8,317,294 කට ලංසුකරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ප්‍රථම 2011 සැප්තැම්බර් 11 දින රු.මිලියන 5 ක්ද, 2011 දෙසැම්බර් 15 දින රු.3,317,294 ක් වශයෙන් එකතුව රු.8,317,294 ක් පුත්තලම දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවා තිබුණි. නමුත් ගිවිසුම් ප්‍රකාරව 2012 අගෝස්තු 24 දින ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කර ගොඩනැගිල්ල තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුව තිබුණි. නමුත් 2014 සැප්තැම්බර් 05 දින වන විටත් තැපැල් කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ නිම කර තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණි. මේ අනුව ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාදවන දිනකට රු.3,713 බැගින් 2012 අගෝස්තු 24 දින සිට 2014 සැප්තැම්බර් 05 දින දක්වා ප්‍රමාද ගාස්තු ලෙස රු.2,758,759 ක් කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතුව තිබුණි.

(ii). ග්‍රැනයිට් ඇතිරීම් නොකර කවුන්ටර් ඉදිකරන ලෙස 2012 සැප්තැම්බර් 14 දින තැපැල්පති විසින් දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා තිබුණත්, අමතර වැඩ සඳහා ගෙවීම් කිරීමේදී ග්‍රැනයිට් ඇතිරීම් වෙනුවෙන්ද රු.143,870 ක් ඇතුළත්ව ගිවිසුම්ගත මුදලට වඩා රු.423,558 ක් දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවා තිබුණි.

**(ඒ) වයික්කාල තැපැල් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම**

වයික්කාල තැපැල් කාර්යාලය නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා කොන්ත්‍රාත්කරු සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව 2011 නොවැම්බර් 23 දින වැඩ ආරම්භ කර 2012 මැයි 23 දින වැඩ අවසන් කළ යුතු වුවත්, 2012 ජනවාරි 31 දින වැඩ ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වැඩ ආරම්භ කිරීමට ප්‍රථම 2011 සැප්තැම්බර් 21 දින රු.5,000,000 ක් හා 2011 දෙසැම්බර් 15 දින රු.3,790,490 ක් වශයෙන් එකතුව රු.8,790,490 ක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ගෙවා තිබුණි. නමුත් 2014 මාර්තු 23 දින ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර තිබුණු බැවින් දිනකට රු.3,924 ක් බැගින් රු.2,625,156 ක ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.

(ii). කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ ආරක්ෂක ඇපකරය වලංගුව පවත්නා දිනය 2012 ජූනි 20 දිනය ලෙස සඳහන්ව තිබුණද, වැඩ අවසන් වූ දිනය අනුව ආරක්ෂක ඇපකරය දීර්ඝ කර ගැනීමක් සිදුකර ඇති බවට විගණනයේදී තහවුරු නොවුණි.

(iii). මෙම ඉදිකිරීමේදී සියයට 7 ක වට්ටමක් එනම් රු.590,758 ක් ලබා දීමට කොන්ත්‍රාත්කරු එකඟවී තිබුණද එම වට්ටම නොසළකා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(iv). ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව අනුව වටිනාකම රු.7,429,450 ක් වුවද, අමතර වැඩ සමඟ මුළු ගෙවීම රු.10,788,892 ක් වී තිබුණි.

(ඔ) **ඇල්ල තැපැල් කාර්යාලය ඉදිකිරීම**

මෙම ඉදිකිරීමේ කටයුතු සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම්වරයා වෙත 2011 ජනවාරි 17 දින පවරා තිබුණ අතර ඒ සඳහා රු.12,028,158 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුව අනුව එකතු කළ අගය මත බදු සමඟ කොන්ත්‍රාත් වටිනාකම රු. 9,709,562 ක් වි තිබුණි. පසුව එම කොන්ත්‍රාත් වටිනාකම රු.9,090,368 ක් ලෙස සංශෝධනය කර තිබුණි. මෙම සංශෝධනය පිළිබඳව දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත්කරු දැනුවත් කර නොතිබුණි.

2012 ජූනි 13 දින වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු වුවත්, 2015 මාර්තු 15 දින දක්වාම එම කාලය වරින් වර දීර්ඝ කර තිබුණි. නමුත් ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 55 ක්ව තිබියදී 2013 ජූලි 23 දින වැඩ නවතා තිබුණි. ඒ වන විටත් කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.9,709,562 ක සම්පූර්ණ මුදලම තැපැල් දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබුණ අතර එම දිනෙන් පසුවද එනම් 2013 දෙසැම්බර් 12 දින රු.2,318,591 ක් නිදහස් කර තිබුණි. ඒ අනුව මුළු ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකමට

සමාන මුදලක් නිදහස් කර තිබුණි. මෙහිදී පැති බැම්මක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් කොන්ත්‍රාත්කරු විසින් පෙන්වා දී තිබුණ අතර එහි ඉංජිනේරු ඇස්තමේන්තුව රු.1,816,839 ක් විය. කෙසේ වෙතත් එම පැති බැම්ම ඉදිකිරීමද සිදුකර නොතිබුණි.

(ඕ) **දොඹගහවෙල තැපැල් කාර්යාලය ඉදිකිරීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශයට පටහැනිව දොඹගහවෙල තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා ආයතන 10 කින් ලංසු කැඳවා ඉන් අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙත එකතු කළ අගය මත බද්ද සමඟ රු.6,890,510 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

ගිවිසුම් ප්‍රකාරව 2011 ජූලි 01 දින ඉදිකිරීම් ආරම්භ කර 2012 ජනවාරි 31 දින අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවත්, ඉදිකිරීම් 2011 සැප්තැම්බර් 24 දින ආරම්භ කර තිබුණු අතර එය නිම කර ගොඩනැගිල්ල 2014 මැයි 23 දින භාර දී තිබුණි. ඒ අනුව දින 842 ක ප්‍රමාද කාලයක් සඳහා ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු වශයෙන් රු.689,051 ක් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම්වලින් අඩු කර ගෙන නොතිබුණි.

**4.10 පාඩු හා හානි**

2014 දෙසැම්බර් 31 දින වන විට තව දුරටත් කපා හැරීමට ඇති හානි හා පාඩු ලෙස රු.9,362,929 ක් විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. එහි 1980 වර්ෂයේ සිට පැවත එන හානි හා පාඩුද ඇතුළත් වී තිබුණි. එම හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනිමට හෝ කපා හැරිමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

**4.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **මුදල් ඇණවුම් සේවා ගිණුම - 2013**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් ඇණවුම් නිකුත් කිරීම, මුදල් ඇණවුම් ගෙවීම් හා මුදල් ඇණවුම් කොමිස් ආදායම දෙපාර්තමේන්තු පරිගණක මෘදුකාංග මගින් ලබාගෙන තිබූ ශේෂයන්, මුදල් ඇණවුම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශයට අනුව පිළිවෙලින් රු.4,957,288,768 ක්, රු.3,589,486,834 ක් හා රු.20,160,650 ක වෙනස්කම් පැවැතුණි.

මෙම වෙනස්කම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද මුදල් ඇණවුම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය, දිසා ගිණුම් සාරාංශ අනුව සකස් කළ ගිණුම් සාරාංශ හා පොත් තැබීම් අංශයෙන් භාණ්ඩාගාරයට වාර්තා කළ මුදල් ඇණවුම් මාසික ගිණුම් සාරාංශ යොදා ගෙන සකස් කර තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පිළිබඳ විස්තර මුදල් ඇණවුම් පාලකට වාර්තා නොකිරීම හේතුවෙන් පොත් තැබීම් අංශයේ ශේෂය සමඟ සැසඳීමේදී මුදල් ඇණවුම් ගෙවීම්වල රු.1,698,025,917 ක් හා මුදල් ඇණවුම් නිකුත් කිරීම්වල රු.1,563,578,271 ක වෙනසක් පැවැතුණි.

**(ආ) මධ්‍යම තැපැල් හුවමාරුවේ විදේශ පාර්සල් අංශයේ සිදුවී ඇති වංචාව**

**------------------------------------------------------------------------------**

2014 මැයි 03 දින ඩුබායි සිට මෙරටට ලැබී තිබුණු සැක සහිත පාර්සල් තුනක් ඉදිරියට යැවීම නවතා 2014 මැයි 03 දින ගුවන් 1 ගබඩාවට භාරදී තිබුණි. මේ සඳහා විමර්ශන කටයුතු ආරම්භ කිරීමට තැපැල්පති විසින් මාස 03 ක ප්‍රමාදයකින් පසු 2014 අගෝස්තු 08 දින නියෝග ලබාදී තිබුණි. ඒ අනුව එක් පාර්සලයක් 2014 අගෝස්තු 08 දින විවෘත කර තිබුණු අතර ඉතිරි පාර්සල් දෙක දින 20 කට පසු 2014 අගෝස්තු 28 දින විවෘත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම අක්‍රමිකතාව මධ්‍යම තැපැල් හුවමාරුවේ විදේශ පාර්සල් අංශයේ නිලධාරීන් හා සේවකයින් රැසක් එකතු වී සිදුකර තිබුණු බවත් මෙවැනි ක්‍රියා මීට පෙරද සිදුකර ඇති බවත් විමර්ශනයන් තුළින් අනාවරණය කර තිබුණි. මෙසේ දුෂ්සන්ධානයෙන් යුතුව අක්‍රමිකතා සිදු කිරීමට, දීර්ඝ කාලයක් එකම ස්ථානයේ එකම රාජකාරියේ නිලධාරීන් සේවයට යෙදවීම ප්‍රධාන හේතුවක් වී තිබුණි.

(ii) ගබඩාවේ පාර්සල් තුළ තිබූ දෑ ඉවත් කර එයට වෙනත් දෑ ඇතුළු කිරීම එම ගබඩාව තුළ රාජකාරී ඉටුකළ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ අනුදැනුමකින් තොරව සිදු කිරීමට නොහැකි බව පිළිගැනීමෙන් පසු පස් දෙනෙකු අඩ වැටුප් සහිතව වැඩ තහනමට ලක්කර තිබුණි. 2015 මාර්තු 13 දින වන විට මධ්‍යම තැපැල් හුවමාරුවේම වෙනත් අංශ සඳහා ඔවුන් නැවත සේවයේ පිහිටුවා තිබුණි.

(iii) මෙම වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවට පත්ව මේ වන විට ඇපපිට නිදහස් කර ඇති නිලධාරීන් හා සේවකයින් 04 දෙනා සහ ඉහත සඳහන්

නිලධාරීන් 05 දෙනෙකු ඇතුළු 09 දෙනෙකු මෙකී චෝදනාවලට ලක්වී අවුරුදු එකකට ආසන්න කාලයක් ගතවී තිබියදීත් දෙපාර්තමේන්තුව විසින් 2015 අප්‍රේල් 30 දින වන විටත් චෝදනා පත්‍ර හෝ නිකුත් කර නොතිබුණි.

**(ඇ) විමර්ශන කටයුතුවල කාර්යසාධනය**

2015 ජනවාරි 19 දිනැති ලිපියෙන් පාලක විමර්ශන වෙතින් පරීක්ෂාවන් සිදුකරමින් පවතින විමර්ශන කටයුතු හා 2014 වර්ෂයේදී නිම කරන ලද විමර්ශන කටයුතුවල තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණත්, තොරතුරු නොමැති බව පාලක විමර්ශන විසින් දන්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාලක විමර්ශන අංශය වෙත එක් එක් විමර්ශනයන් සඳහා විමර්ශන භාරදුන් දිනයන් ලබා නොදීම හේතුවෙන් 2014 ජනවාරි 01 දිනට ඉතිරිව පැවති විමර්ශනවල ප්‍රමාදය පිළිබඳව නිගමනයකට එළඹීමට නොහැකි වී තිබුණි.

(ii) 2014 ජනවාරි 01 දිනට පැවති මූලික විමර්ශන සංඛ්‍යාව 2,202 ක් හා 2014 වර්ෂයේදී ලැබුණු විමර්ශන වාර්තා සංඛ්‍යාව 1,138 ක් විය. වර්ෂය තුළ පරීක්ෂණ කටයුතු නිම කළ සංඛ්‍යාව 737 ක් වූයෙන් 2014 දෙසැම්බර් 31 දිනට මූලික විමර්ශන කටයුතු නිම කිරීමට ලිපිගොනු 2,603 ක් පැවතිණි. ඒ අනුව 2014 වර්ෂය තුළදී මූලික විමර්ශන කටයුතු නිම කිරීමේ සමස්ත ප්‍රගතිය සියයට 22 ක් විය. එක් එක් කොට්ඨාශවල මූලික විමර්ශන කටයුතුවල ප්‍රගතිය වෙන වෙනම පරීක්ෂා කිරීමේදී පාලක විමර්ශන අංශයේ ප්‍රගතිය සියයට 6 ක් වූ අතර අනෙකුත් කොට්ඨාශවල සියයට 9 සිට සියයට 47 දක්වා ප්‍රගතියක් වාර්තා වී තිබුණි.

(iii) විධිමත් විනය පරීක්ෂණ පිළිබඳ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී 2014 ජනවාරි 01 දිනට පරීක්ෂණ කටයුතු සිදු කිරීමට ලිපිගොනු 38 ක් පැවතුණ අතර 2014 වර්ෂයේදී ලිපිගොනු 16 ක් ලැබී තිබුණි. වර්ෂය තුළ නිම කරන ලද ලිපිගොනු සංඛ්‍යාව 09 ක් පමණක් වූයෙන් තවදුරටත් පරීක්ෂණ කටයුතු නිම කිරීමට ලිපිගොනු 45 ක් පැවතිණි. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීමේ සමස්ථ ප්‍රගතිය සියයට 17 ක් විය. ඒක් එක් කොට්ඨාශවල විධිමත් විමර්ශන කටයුතුවල ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී පාලක විමර්ශන හා බස්නාහිර, උතුරු මැද, නැගෙනහිර පළාත්වල කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි. අනෙකුත් කොට්ඨාශවල ප්‍රගතිය සියයට 22 සිට සියයට 50 ක් දක්වා විහිදී තිබුණි.

(iv) දැනට තැපැල් දෙපාර්තමේන්තුවේ විමර්ශන පරීක්ෂණ නිලධාරීන් අනුමත සංඛ්‍යාව 51 ක් වී තිබුණත්, පුරප්පාඩු 18 ක් විය. විමර්ශන කටයුතුවල ප්‍රගතිය අවම වීමට නිලධාරීන් හිඟයද බලපා තිබුණි.

## 4.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 121 | 82 | 39 |
| (ii) | තෘතීයික මට්ටම | 147 | 61 | 86 |
| (iii) | ද්වීතියික මට්ටම | 8,854 | 7,336 | 1,518 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17,659 | 16,929 | 730 |
| | **එකතුව** | **26,781** | **24,408** | **2,373** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 2,373 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### (ආ) කාර්ය මණ්ඩල විස්තර හා වැටුප් ගෙවීම් පරීක්ෂාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැපැල් දෙපාර්තමේන්තුවේ දීපව්‍යාප්තව විහිදී ඇති කාර්යාල, තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල සේවයේ නියුක්ත සියළුම සේවකයින්ගේ විස්තර තැපැල් මූලස්ථානයේ පාලන අංශයෙන් ලබාගැනීමට හැකියාවක් තිබිය යුතු වුවත් එවැනි හැකියාවක් නොතිබුණි.

(ii) තැපැල් මූලස්ථානයට අනුයුක්ත නිලධාරීන්ගේ තොරතුරු පමණක් සකස් කර ඉදිරිපත් කර තිබුණත්, එම තොරුතුරුද යාවත්කාලීන කර නොතිබුණි.

### (ඇ) ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාර්න්ට වැටුප් ගෙවීම

බුද්ධ ශාසන අමාත්‍යාංශයට 2012 අගෝස්තු 16 දින ස්ථාන මාරුවී ගිය රියදුරෙකු වෙත තැපැල් දෙපාර්තමේන්තුවෙන් වැටුප් ගෙවා තිබුණි.